# සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
## සබරගමුව පළාත් සභාව
## ටෙන්ඩර් කැඳවීමයි

සබරගමුව පළාතේ කැගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි මගීන් සඳහා සාමාන්‍යය/සුඛෝපභෝගී පොදු ප්‍රවහන පහසුකම් ලබා දීම වෙනුවෙන් නව මාර්ග වල බලපත්‍ර නිකුත් කිරීම සඳහා තරඟකාරී මිල ගණන් කැඳවීමට තීරණය කර ඇත. ඒ අනුව එම මාර්ග සඳහා අවම ලංසුගත මුදල හා අදාළ තොරතුරු පහත පරිදි වේ.

- 2022/0/07 සිට 2022/10/20 ප.ව. 2.00 දක්වා ලංසු කැඳවීම විවෘතව පවතී.

---

| අ/අ | දිස්ත්‍රික්කය | මාර්ගය | අවම ලංසුගත මුදල (රු) | බලපත්‍ර ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1 | කැගල්ල | මාවනැල්ල- අවිස්සාවේල්ල | 1,000,000.00 | 1 | ❖ සුඛෝපභෝගී සේවා.<br>❖ පූර්න ගමන්වාර 2ක් ලබා දේ |
| 2 | කැගල්ල | මාවනැල්ල - කැගල්ල | 500,000.00 | 1 | ❖ සුඛෝපභෝගී සේවා.<br>❖ පූර්න ගමන්වාර 2ක් ලබා දේ<br>❖ මාවනැල්ල දුර ගමන් සේවා නැවතුම රංවල ආයුර්වේද රෝහල පොළහුමිය |
| 3 | කැගල්ල | රඹුක්කන - වරකපොළ | 300,000.00 | 1 | ❖ සුඛෝපභෝගී සේවා.<br>❖ පූර්න ගමන්වාර 2ක් ලබා දේ |
| 4 | කැගල්ල | මාවනැල්ල- රඹුක්කන- දොඹේමඩ හරහා කුරුණෑගල | 1,000,000.00 | 1 | ❖ සුඛෝපභෝගී සේවා.<br>❖ පූර්න ගමන්වාර 2ක් ලබා දේ |
| 5 | කැගල්ල | වාරියගොඩ - රත්නපුර | 500,000.00 | 1 | ❖ සුඛෝපභෝගී සේවා.<br>❖ පූර්න ගමන්වාරක් ලබා දේ |
| 6 | කැගල්ල | වාරියගොඩ - පිටගල්දෙනිය | 200,000.00 | 1 | ❖ සාමාන්‍යය සේවා<br>❖ ගලපිටමඩ මාර්ගය තුංතොට පිටගල්දෙනිය |
| 7 | කැගල්ල | කැගල්ල නගර සේවා 01 | 200,000.00 | 2 | ❖ සාමාන්‍යය සේවා<br>❖ කැගල්ල නගරය, පොළීසිය, බණ්ඩාරනායක මාවත, බාලිකා විද්‍යාලය, කැගල්ල රෝහල |
| 8 | කැගල්ල | කැගල්ල නගර සේවා 02 | 200,000.00 | 2 | ❖ සාමාන්‍යය සේවා<br>❖ කැගල්ල නගරය, ශාන්ත ජෝශප්/ ශාන්ත මරියා විද්‍යාලය, නව නුවර පිවිසුම හරහා පොළහුමිය(නිදහස් මාවත) හරහා කැගල්ල |
| 09 | කැගල්ල | රඹුක්කන- දොඹේමඩ හරහා කුරුණෑගල | 300000.00 | 1 | ❖ සාමාන්‍යය සේවා යටතේ පොරොත්තු බස් රථයකි |
| 10 | කැගල්ල | රඹුක්කන නගර සේවා 01 | 200000.00 | 1 | ❖ රඹුක්කන නගරය, රෝහල, වහව හංදිය, රඹුක්කන නගරය |
| 11 | කැගල්ල | රඹුක්කන නගර සේවා 02 | 200000.00 | 1 | ❖ රඹුක්කන - අශෝක විද්‍යා,ලය දියසුන්නත අශෝකාරාමය, |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | රඹුක්කන නගරය |
| 12 | රත්නපුර | රත්නපුර - ඇඹිලිපිටිය | 2,000,000.00 | 1 | ❖ සාමාන්‍යය සේවා යටතේ පොරොත්තු සේවා අංක 02 |
| 13 | රත්නපුර | බලංගොඩ - රත්නපුර - නව නගරය | 1,000,000.00 | 1 | ❖ සුබෝපභෝගි සේවා.<br>❖ පූර්න ගමන්වාර 2ක් ලබා දේ |

**<u>කොන්දේසි</u>**

01.ඉල්ලුම්කරු සබරගමුව පළාතේ පදිංචිකරුවකු විය යුතුය.
02. ඉල්ලුම් කරනු ලබන මුදල අවම ලංසුගත මුදලට වඩා වැඩි අගයක් විය යුතුය.
03. මාර්ග බලපත්‍ර සඳහා අයදුම්පත්‍ර ගාස්තුව වන රු.1000/-ක්ද, වාර්ෂික බලපත්‍ර සඳහා ගෙවිය යුතු සේවා ගාස්තු (ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදල), එක් වරකට සුභසාධක ගාස්තු වන රු.5000/-ක්ද ගෙවිය යුතු අතර, වාර්ෂිකව අළුත්කිරීමේ බලපත්‍ර ගාස්තුව රු.6700/-ක්ද ගෙවිය යුතුය.
04. බලපත්‍ර කොන්දේසිවලට යටත්ව ස්ථිරවම ලබාදෙනු ලැබේ.
05. මාස 03 කට වැඩි කාලයක් බලපත්‍ර ලබාගත් අය විසින් ධාවනයට එක්කරනු නොලැබේ නම් හේතු නොදක්වා බලපත්‍රය අහෝසිකිරීමේ බලය සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති සතුය.
06. මාර්ග බලපත්‍රය නිකුත් කිරීමේ/ නොකිරීමේ අයිතිය සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති සතුය.
07. ටෙන්ඩර් කිරීමේදී ආපසු ගෙවන ලද රු.5000/- තැන්පතු මුදලක් ටෙන්ඩර් ගාස්තු ලෙස අයකරන අතර, එය ටෙන්ඩරය අවසානයේ ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. නමුත් ටෙන්ඩරය ලබාගත් ඉල්ලුම්කරු ටෙන්ඩරය ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ රු.5000/- තැන්පතු මුදල මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගිණුමට බැරවන අතර නැවත කිසිදු ප්‍රසම්පාදන කටයුත්තක් සඳහා අවකාශ ලබා නොදෙනු ලැබේ .

**<u>ඉල්ලුම් කිරීම</u>**

කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල ප්‍රවාහන අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වෙතින් රු1000/- ආපසු නොගෙවන මුදලක් ගෙවා අයදුම්පත්‍රය පුරවා 9*4 ලිපි කවරයක බහා හොඳින් අලවා එම කාර්යාලවල තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරන මාර්ගය හා දිස්ත්‍රික්කය සඳහන් කල යුතුය. සෑම අයදුම්පත්‍රයක් සමඟම විස්තර පත්‍රිකාවක් ඔබට ලබාදෙනු ඇත.

- ❖ ගෙවන ලද රු.1000/- රිසිට්පත රු.5000/- ටෙන්ඩර් ගාස්තුවට අදාල රිසිට්පත අයදුම්පත්‍රයේ ඇලවිය යුතුය.
- ❖ මෙම ලිපි කැඳවීමේ අවසන් දිනය 2022/10/20දින වන අතර, එදින ප.ව:2.00ට මිල කැඳවීමේ කාලය අවසන් වේ.
- ❖ 2022/10/20වන දින සවස 2.40ට ඉල්ලුම්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හමුවේ ටෙන්ඩර් පෙට්ටිය විවෘත කරනු ඇත.
- ❖ 2022/10/22. වන දින ප.ව:2.00 වන තෙක් අදහස් හා විරෝධතා දැන්වීම සඳහා කාලය ලබාදෙන අතර, ඉන්පසුව ඇගයීම් කමිටුව වෙත අදාල බලපත්‍ර ලබාදීමෙන් නිර්දේශ ලබාදෙන අතර නැවත ස්ථිර ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අනුමැතිය ලබාදීමෙන් පසු මාර්ග බලපත්‍ර ලබාදීමට කටයුතු කරනු ලැබේ.
- ❖ ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසු ඇගයීම් කමිටුව මගින් ඇගයීමක් කර ඉහල මිල ඉදිරිපත් කල ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩර් ප්‍රදානය කරනු ලබයි.
- ❖ ඉහලම මිල ඉදිරිපත් කර ඇති ඉල්ලුම්කරුවන් අදාල මුදල 2022/10/31 ප.ව:2.30 ට පෙර ගෙවීම් කල යුතුය.
- ❖ ඉල්ලුම්කරුවන් විසින් අදාල මුදල රත්නපුර මුදල් අයකැමි වෙත එකවර මුදලින් ගෙවීමට කටයුතු කල යුතුය.

**සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, නිල වෙබ් අඩවිය https://sgprpta.sg.gov.lk/ හා දුරකථන අංක 045-2222085/035-2232295 ඔස්සේ වැඩිදුරටත් තොරතුරු ලබාගත හැකිය.**

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,**
**සබරගමුව පළාත් සභා සංකීර්ණය,**
**නව නගරය,**
**රත්නපුර.**